# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2114/1 - 2019 මාර්තු මස 11 වැනි සඳුදා - 2019.03.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 15/2014(II)

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 57 වන වගන්තිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සාදනු ලබන රීති.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
*(සඳහා සහ වෙනුවෙන්),*
සභාපති.

2019 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මේ රීති 2019 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (තීරකවරුන්ගේ නාමලේඛනය) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් -

(අ) මෙහි උපලේඛනයේ දක්වා ඇති විස්තර ඇතුළත් තීරකවරුන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යාමට ; සහ

(ආ) නිතිපතා යාවත්කාලීන කිරීමට ;

සැලැස්විය යුතු ය.

3. (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කරන ලද සෑම තීරකයකුම, අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන තීරකවරුන්ගේ නාමලේඛනයේ ඇතුළත් කරනු ලැබිය යුතු ය.

4. තීරකවරුන්ගේ නාමලේඛනය නාමාවලියක් මෙන්ම මහජනතාවට ප්‍රවේශ විය හැකි වෙබ් අඩවි නාමාවලියක් ලෙසද පවත්වාගෙන යනු ලැබිය යුතු ය.


1A - PG 4459 — 517 (2019/03)

*සැ. යු.- අති විශේෂ ගැසට් අංක 2113/1 කාණ්ඩය අංක 2113/68 අවසන් වේ.*

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

### *තීරකවරුන්ගේ නාමලේඛනය පවත්වාගෙන යාමේ ආකෘතිය සහ ආකාරය*

(2 වන රීතිය)

1. තීරකවරුන්ගේ නාමලේඛනය, ගෙවීමකින් තොරව පරීක්ෂා කිරීම සඳහා, අධිකාරියේ කාර්යාලයේ තැබිය යුතු නාමාවලියක් ලෙස මෙන්ම වෙබ් නාමාවලියක් ලෙස අධිකාරියේ වෙබ් අඩවියේ ද අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

2. තීරකවරුන්ගේ නාමලේඛනයේ, එකී නාමාවලියේ ඇතුළත් කළ යුතු පහත දැක්වෙන තොරතුරු ඇතුළත් කළ යුතු අතර, ලියාපදිංචිය සම්පූර්ණ කිරීමෙන් පසුව වෙබ් නාමාවලියට අත්පතනය කිරීම ද කළ යුතු ය :-

(අ) තීරකගේ ඡායාරූපය ;

(ආ) ලියාපදිංචි අංකය ;

(ඇ) තීරකගේ නම ;

(ඈ) සුදුසුකම් ;

(i) අධ්‍යාපන

(ii) වෘත්තීය

(ඉ) විශේෂිත ක්ෂේත්‍රය ;

(ඊ) ලිපිනය ;

(උ) දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය ;

(ඌ) පළමු ලියාපදිංචියේ දිනය සහ වලංගු ලියාපදිංචි කාල සීමාව.

3. තීරකවරුන්ගේ නාමලේඛනය පහත දැක්වෙන සිදුවීම්වල දී යාවත්කාලීන කරනු ලැබිය යුතු ය :-

(අ) නව තීරකවරයකු ලියාපදිංචි කිරීම ;

(ආ) ලියාපදිංචි කරන ලද තීරකවරයකුගේ ලියාපදිංචිය අලුත් කිරීම ;

(ඇ) ලියාපදිංචි කරන ලද තීරකවරයකුගේ ලියාපදිංචිය අලුත් නොකිරීම.

03 - 1216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.